# පොත්ත කුණුවීමේ රෝගයට අවුරුද්ද පුරා බෙහෙත් ආලේප කල යුතුද?

එන්. අයි. එස්. ලියනගේ

රබර් ශාකයේ පොත්ත කුණුවීම (පයිටොප්තෝරා කලු ඉරි රෝගය) අපට නිතර දකින්ට ලැබෙන රෝගයකි. වැඩි වශයෙන්ම පොත්ත කුණුවීම ආරම්භ වන්නේ කැපුම් කට්ටයට මිලි මීටර් කීපයක් උඩිනි. ප්‍රථමයෙන්ම තද දුඹුරු/කළු පැහැති යටට නෙරාගිය පුල්ලි සමාන්තරව කැපුම් කට්ටයට උඩින් හටගන්නා අතර ඒවා ක්‍රම ක්‍රමයෙන් ඉහළට සහ පහළට පැතිරී යයි. මෙය බහුල වශයෙන් දකින්නේ නිරිත දිග මෝසම් කාලයේයි. එනම්, මැයි, ජුනි, ජූලි යන මාසවලයි. තවද, සුළු වශයෙන් ඊසාන දිග මෝසම් කාලයේද මෙය හටගනී. දිය පාරවල් අසල හෝ තෙතමනය රඳා පවතින ස්ථාන වලද ඇති ශාක වල පොත්ත මෙම රෝගයට පහසුවෙන් ගොදුරු වේ. එමනිසා, වගාව පරීක්ෂා කිරීමේදී මෙවැනි ස්ථාන වල ඇති ශාක ගැන විශේෂ උනන්දුවක් දැක්විය යුතුය.

රෝගය හට ගැනීමට අදාලවන දිලීරය පයිටොප්තොරා මීඩියායි යන්නයි. මෙම දිලීරය වැඩීම ප්‍රථමයෙන් සිදු වන්නේ රබර් ගෙඩිවලය. එමනිසා ගෙඩි තරමක් දුරට විශාල වනවිට එනම් අප්‍රියෙල් මාසයේ පමණ මෙම දිලීරය ඇතුල් වීමෙන් රෝගී බවට පත්වේ. මේ අවස්ථාවේදී ගෙඩි මත කලු පැහැති හෝ තෙතමනය සහිත පුල්ලි හටගනී. ක්‍රමයෙන් මෙම ගෙඩි මත දිලීර බීජාණු හටගෙන සුදුපාට පුළුන් රොදක් මෙන් වැසී යයි. මෙම බීජාණු වැහි බිංදු මගින් පහසුවෙන් ගිලිහී පත්‍රවල පතිත වේ. මෙහිදී බහුලව රෝග ලක්ෂණ ඇතිවන්නේ පත්‍ර මත නොව පත්‍ර නටුවේයි. දුඹුරු/කළු පුල්ලියක් එහි හටගන්නා අතර බීජාණුව නටුවට ඇතුලුවූ ස්ථානයේ බොහෝවිට කිරි බිංදුවක් ද දක්නට ලැබේ. මෙම අවස්ථාව නිතර දක්නට ලැබෙන්නේ මැයි සිට ජූලි මස දක්වායි. රෝගයට ගොදුරු වූ නටු පත්‍රත් සමග පතිත වේ. මෙය පයිටොප්තොරා කොල හැලීමේ රෝගය නමින් හැඳින්වේ. මීට අමතරව මෙම බීජාණු ගසේ කඳ දිගේ වැසි වතුර සමඟ අවුත් කැපුම් කට්ටය තුලින් ගසට ඇතුලු වී පොත්ත කුණු වීමේ රෝගය ඇතිකරයි. සාමාන්‍ය වශයෙන් ජූලි, අගෝස්තු යන මාසවල මෙම අවස්ථාව දක්නට ලැබේ. අගෝස්තු වියළි කාලය එත්ම ගෙඩි මෝරා පුපුරා හැලෙන අවස්ථාවද එළඹෙයි. එවිට දිලීරය ව්‍යාප්ත වීමට උපකාරීවන ගෙඩි නොමැති හෙයින් රෝගය ක්‍රම ක්‍රමයෙන් අඩුවී යයි.

අවුරුදු කීපයකට ප්‍රථම පොත්ත කුණුවීමේ රෝගයට ප්‍රතිකාර වශයෙන් බෙහෙත් ආලේප කිරීම දිනපතා කිරි කැපීමෙන් පසු කෙරිනි. මෙය අවුරුද්ද පුරාම කිරීම සමහර රබර් වවන්නන්ගේ සිරිතකි. ඉතාමත් සුලු

බිම් කොටසක රබර් වගා කරන ඉඩම් හිමියන් මෙම රෝගය මර්ධනය නොකලද සාමාන්‍ය වශයෙන් අක්කර 10 ක් හෝ ඊට වැඩි බිම් ප්‍රමාණයක් ඇති ඉඩම් හිමියන් රෝග මර්ධන ක්‍රම භාවිතා කරති. මෙම රෝගය මැඩපැවැත්වීමට බෙහෙත් ආලේප කල යුත්තේ මැයි සිට සැප්තැම්බර් මාසය දක්වා පමණි. ඊට හේතුව නම් රෝගීවූ රබර් ගෙඩි සාමාන්‍ය වශයෙන් පවතින්නේ මෙම කාල සීමාව තුලයි.

තවද බෙහෙත් ආලේප කල යුත්තේ පළමුවැනි (ඒ) කැපුම් කට්ටය සහ දෙවැනි (බී) කැපුම් කට්ටය මතයි. සී සහ ඩී කැපුම් කට්ටය මත රෝගය පැතිරෙනුයේ ඉතා සෙමින් හා මඳ වශයෙනි. කිරි කැපීම කරගෙන යන අතර රෝගී පොත්ත ඉවත් වන බැවින් එම ගස්වල රෝගය ඉබේම අඩුවී යයි. එමනිසා පෙර සඳහන් කරඇති පරිදි බෙහෙත් ආලේප කල යුත්තේ පළමුවැනි (ඒ) සහ දෙවැනි (බී) කැපුම් කට්ටය මත පමණි. බ්‍රනොලිනම් (15%) සාන්ද්‍රයෙන් හෝ සැන්ඩොපාන් නැමැති නව බෙහෙත් වර්ගයක් මේ සඳහා පාවිච්චි කල හැක. රෝගය උග්‍ර අන්දමට පැතිරී ඇතිනම් රෝගී පොත්ත මුළුමනින් ඉවත්කොට මෙම බෙහෙතක් ආලේප කල යුතුයි. බෙහෙත් ආලේප කිරීමෙන් පසු මෙම ස්ථානය බාර්කොසාන්, ෂෙල් ටී. බී. 192 වැනි ග්‍රීස් සහිත ආලේපයකින් වසා දැමිය යුතුයි. තවද, පොත්ත ඉවත් කිරීම හේතුකොටගෙන ගසට විශාල තුවාලයක් ඇති වී නම්, රබර් ලීය පෑදී ඇති ස්ථානයේ ගුල්ලන් ගැසීම වැලැක්වීමට තාර ඇලේප කල හැක. කෙසේවෙතත් තාර පොත්තේ නොගෑවීමට වග බලාගත යුතුයි.

මෙම රෝගය මැඩ පැවත්වීම සඳහා කලින් සඳහන් පරිදි රෝගය සෑදීමට පහසු ස්ථාන ගැන විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුයි. තවද, අවුරුද්ද මුලදී සාමාන්‍ය වශයෙන් හටගන්නා ඔයිඩියම් කොල රෝගය අඩුව පවතින අවුරුදුවලදී පයිටොප්තොරා රෝගය ගැන විශේෂ අවධානවක් යොමු කල යුතුයි. රෝගය සාමාන්‍ය වශයෙන තිබෙනුයේ මැයි සිට සැප්තැම්බර් කාල සීමාව තුලදීය. මෙම මාස 5 තුළ රබර් ගස මෙකී රෝගයෙන් ප්‍රවේසම් කර ගතහොත් වගාව නිසි අන්දමට පවත්වා ගෙන යා හැක.